# කොවිඩ් 19 වසංගත තත්ත්වය තුළ පාඨක තොරතුරු අවශ්‍යතා සම්පූර්ණ කිරීම සඳහා ඩිජිටල් පුස්තකාලවල දායකත්වය: දේශීය හා විදේශීය නිදසුන් ආශ්‍රයෙන් අධ්‍යයනයක්

**එම්.ජී.එච්.කේ. විජේරත්න**

**සාරාංශය**

කොවිඩ්-19 වසංගතය ලෝකය පුරා පුස්තකාල තුළ දැඩි වෙනස්කම් ඇති කළ අවස්ථාවක් විය. එය සමාජයේ සෑම ක්ෂේත්‍රයකටම බලපෑම් ඇති කළ අතර, අධ්‍යාපන ක්ෂේත්‍රයද පසුබෑමකට ලක්විය. මෙවන් අභියෝගාත්මක කාලයකදී, පුස්තකාලයන් සම්ප්‍රදායික සේවා සීමාවන් පසුකරමින්, නවීන තාක්ෂණය සහ ඩිජිටල් සම්පත් මත පදනම්ව සේවා ලබාදීමට පියවර ගන්නා ලදි. කොවිඩ් වසංගතය සමග සිදු වූ විශාල වෙනස්කම්වලට මුහුණදෙමින්, පුස්තකාල සේවා නව මාදිලියකට ගෙනයන උත්සාහයන් විශාල වශයෙන් වර්ධනය විය. UNESCO සහ IFLA වැනි ජාත්‍යන්තර ආයතන විසින් ඉදිරිපත් කළ Digital Libraries Manifesto, එක පදනම්ව, ජාතික හා ජාත්‍යන්තර පුස්තකාල සේවා ආයතන මගින් විවිධ ඩිජිටල් පුස්තකාල මූලාශ්‍රය සංවර්ධනය කරන ලදි. මෙම ලිපියේ අරමුණ වන්නේ, කොවිඩ්-19 වසංගතය හමුවේ පුස්තකාලයන් මගින් ලබාදුන් නවීන ඩිජිටල් සේවා කෙරෙහි විමසුමක් සිදු කිරීමයි. එමඟින්, නව තාක්ෂණයන් භාවිතයෙන් පුස්තකාලයන් තොරතුරු විහිදුම, අධ්‍යාපනය හා සංස්කෘතිය සම්බන්ධව ක්‍රියාත්මක කළ ආකාරය අවබෝධ කරගැනීමට අපේක්ෂා කරනු ලැබේ.

**ප්‍රමුඛ පද:** අධ්‍යාපනය, කොවිඩ් -19, ඩිජිටල් පුස්තකාල සේවා, තොරතුරු තාක්ෂණය, නවීන වැඩපිළිවෙල

## හැඳින්වීම

කොවිඩ් 19 නොහොත් කෝරෝනා වෛරස් රෝගය මුල්වරට චිනයේ වූහාන් නුවරදී හඳුනාගත් අතර පසුව ලොව පුරා සීඝ්‍රයෙන් පැතිර ගොස් ගෝලීය වසංගතයක් බවට පත් විය. ශ්‍රී ලාංකීක වැසියන්ට පමණක් නොව ලොව සියලුම ප්‍රජාවන්ට තම එදිනෙදා ජීවිතයේ ක්‍රියාකාරිත්වය ඇණ හිටුවීමට එල්ලවූ දරුණුතම පහරක් ලෙස මෙම වසංගත රෝගය හැඳින්විය හැකි ය.

ලොව පුරා රාජ්‍ය, පෞද්ගලික ආයතන , විශ්වවිද්‍යාල වැනි ආයතන තාවකාලිකව වසා දමන්නට සිදු විය. මෙම තත්ත්වය මත නිවසේ සිට සියලු දෙනාටම රාජකාරි, අධ්‍යාපනික කටයුතු මාර්ගගතව (online) කීරීමට ද සිදු විය. අද වන විට පෙර නොවූ විරූ ප්‍රමාණයෙන් දුරස්ථ ඉගෙනුම්, ඩිජිටල් මාධ්‍යයන් සඳහා සංක්‍රමණය වන ප්‍රමාණය ද ඉතා සීඝ්‍ර වශයෙන් ඉහළ ගොස් ඇත . එය පහත දැක්වෙන 2020 ඔක්තොම්බර් මාසය වන විට ලොව පුරා ඩිජිටල් මාධ්‍ය භාවිතයට යොමු වී ඇති ප්‍රජාවගේ සංඛ්‍යාත්මක දත්ත හරහා මනාව විද්‍යමාන වේ.




(Info:-https://datareportal.com/reports/digital-2020-october-global-statshot )

ඒ් අනුව මෙම සංඛ්‍යාත්මක දත්තවලට අනුව ඔක්තොම්බර් මාසය වන විට ලොව පුරා ඩිජිටල් මාධ්‍ය භාවිත කරන ප්‍රමාණය බිලියන 7.81 ද ජංගම දුරකථන භාවිත කරන්නන් බිලියන 5.20 ද අන්තර්ජාලය භාවිත කරන්නන් බිලියන 4.66 ද සමාජ මාධ්‍ය භාවිත කරන පරිශීලක ප්‍රමාණය බිලියන 4.14 ද වී ඇත.




(Info :https://datareportal.com/reports/digital-2020-july-global-statshot)

කොවිඩ් 19 වසංගත තත්ත්වය තුළ මාර්ගගත හා ඩිජිටල් ක්‍රියාකාරකම් සඳහා යොමු වූ ප්‍රමාණයන්හි සීඝ්‍ර වර්ධනයක් සිදු වී ඇති බව උක්ත සංඛ්‍යා දත්ත හරහා මනාව ගම්‍යමාන වේ.

එලෙස මෙම කොවිඩ් 19 වසංගතය තුළ පාඨක තොරතුරු අවශ්‍යතා සම්පූර්ණ කිරීම සඳහා වෙන කිසිදු පුස්තකාලයකට සමකළ නොහැකි, අද්විතීය අසම සම සේවා ප්‍රමාණයක් සැපයිය හැකි සුවිශේෂී පුස්තකාලය වනුයේ ඩිජිටල් පුස්තකාලයයි.

වර්ගීකරණයට හා සූචිකරණයට නව මාර්ගයක්, ගබඩා කිරීමට හා සංරක්ෂණයට නව විධි ක්‍රම, ප්‍රතිග්‍රහණය සඳහා වූ නව මාර්ගයක් නවතම තාලයේ තොරතුරු මූලාශ්‍රයන් ආදියෙන් යුක්තව පුස්තකාලයේ කාර්යයන් නව මාවතකට ප්‍රවිශ්ට කරලීමක් ලෙස රවී චන්ද්‍ර රාඹ් සහ පී. සූමා (1996) යන දෙදෙනා විසින් ඩිජිටල් පුස්තකාල හඳුන්වා දී ඇත.

එපමණක් නොව,

"Manifesto for Digital Libraries, UNESCO and the International Federation of Library Associations and Institutions (IFLA) point out that 'The mission of the digital library is to give direct access to information resources […] in a structured and authoritative manner and thus to link information technology, education and culture in contemporary library service''. (Eric Falt and Pratha Pratim Das ;nd)

UNESCO සහ IFLA සිය ඩිජිටල් පුස්තකාල සඳහා වන ප්‍රතිපත්ති ප්‍රකාශනයෙන් පෙන්වා දෙන්නේ , ඩිජිටල් පුස්තකාලයක මෙහෙවර වනුයේ ව්‍යුහාත්මක හා සාධිකාරිත්ව බවකින් යුතුව තොරතුරු තාක්ෂණය , අධ්‍යාපනික හා සංස්කෘතික වශයෙන් සම්බන්ධිත තොරතුරුවලට පාඨකයන්ට ප්‍රවේශ වන්නට අවස්ථාව ලබාදීම වන බවයි. මේ අනුව අනෙකුත් සම්ප්‍රදායික පුස්තකාලවලට සාපේක්ෂව ඩිජිටල් පුස්තකාල හරහා සුවිශේෂී කාර්යභාරයක් පාඨකයන් වෙනුවෙන් සිදු කිරීමට ඇති බව මනාව ප්‍රකට වේ.

කොවිඩ් 19 වසංගත තත්ත්වය තුළ පාඨක තොරතුරු අවශ්‍යතා සම්පූර්ණ කිරීම සඳහා දෙස් විදෙස් ඩිජිටල් පුස්තකාල හරහා සුවිශේෂී කාර්ය භාරයක් සිදු කරනු ලැබේ . ඒ පිළිබඳව පහත නිදර්ශක ඔස්සේ විමසා බැලිය හැකි වේ.

**සාකච්ඡාව**

**1. ඉන්දීයාවේ ජාතික ඩිජිටල් පුස්තකාලය** (National Digital Library of India – NDLI )

ලොව පවතින විවිධ ඩිජිටල් පුස්තකාල අතුරින් ඉතා ප්‍රකට සුවිශේෂී ඩිජිටල් පුස්තකාලයක් ලෙස ඉන්දීයාවේ ජාතික ඩිජිටල් පුස්තකාලය (National Digital Library of India – NDLI ) හැඳින්විය හැකි ය. ඉන්දීයාවේ ජාතික පුස්තකාලය (NDLI) යනු ඉගෙනුම් සම්පත්වල අතථ්‍ය ගබඩාවකි. එය සෙවුම් පහසුකම් සහිත ගබඩාවක් පමණක් නොව පාඨකයන් සඳහා සේවාවන් රාශියක් සපයන්නකි.

ඉන්දීයානු රජයේ අධ්‍යාපන අමාත්‍යංශය විසින් තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය හරහා අධ්‍යාපනය පිළිබඳ ජාතික මෙහෙවර (NMEICT) හරහා අනුග්‍රහය හා උපදේශනය ලබාදෙනු ලැබේ. NDLI විසින් පාසල් හා විශ්වවිද්‍යාල සිසුන්, රැකියා අපේක්ෂකයින්, පර්යේෂකයින් යනාදී සියලු දෙනා සඳහා පෘථුල සේවා සමුදායක් සපයනු ලැබේ.

මෙලෙස පෘථුල සේවාවක් සපයනු ලබන භෘබෂ පුස්තකාලය කොවිඩ් 19 වසංගතය තුළද සිය පාඨකයන් සඳහා සුවිශේෂී වූ සේවා රැසක් සපයා ඇත. එහිදී,

උදා : - කෝරෝනා වසංගතය හේතුවෙන් බොහෝ සිසුන්ට සිය පාසල් වෙත ගොස් ඉගෙන ගැනීමට ඇති ඉඩ ප්‍රස්ථාව අහිමි වන්නට විය. මෙයට විකල්පයක් ලෙස, NDLI පුස්තකාලය ‘STAY AT HOME’ මොඩියුලය ඔස්සේ පාසල් සිසුන්ට සිය නිවෙස්වල සිටම සෞඛ්‍ය ආරක්ෂිතව මාර්ගගතව (online) ඉගෙන ගැනීමට අවස්ථාව ලබා දී ඇත.

එහිදී Video lectures (විඩියෝ දේශනවලට) සහභාගිවන්නට අවස්ථාව ලබා දී ඇත. මෙය කිසිදු මුදලක් වැය නොකර නොමිලේ මේ සඳහා ප්‍රවේශය ලබා දී ඇත. එසේම අදාළ තොරතුරු පෙරා ගෙන (filter) කර ද ලබාගත හැකි ය. එහිදී පහත ශීර්ෂයන් ඔස්සේ තොරතුරු පෙරා (filter) ලබා ගැනීමට අවස්ථාව ලබා දී ඇත.

- Access Restriction - ප්‍රවේශන සීමා
- (open)
- Author – කර්තෘ
- Subject Category – විෂය කාණ්ඩය
- Education Level – අධ්‍යාපන මට්ටම
- Language - භාෂාව
- Learning Resource Type - ඉගෙනුම් මූලාශ්‍රය වර්ගය (Activities, vedio learning)

- Source – මූලාශ්‍රය

මෙලෙස ඉතා පහසුවෙන් පාඨක මිත්‍රශිලි අතුරු මුහුණතකින් යුතුව කාර්යක්ෂමව පාසල් සිසුන්ට වීඩියෝ දේශන ඔස්සේ තොරතුරු ලබා ගැනීමට අවස්ථාව ලබා දී තිබේ.

- මීට අමතරව පාසල් පෙළ පොත්, විවිධ විභාගවලට අවශ්‍ය ප්‍රශ්න පත්‍ර, ඒ සඳහා විසඳුම් සහ බෝහෝ අධ්‍යයන ද්‍රව්‍ය ඔස්සේ පාසල් සිසුන්ට ද ගුරුවරුන්ට ද තොරතුරු ලබා ගැනීමට අවස්ථාව ලබා දී තිබේ.

- තවද රජයේ ආයතන, කේන්ද්‍රීය විද්‍යාල, රාජ්‍ය නොවන ආයතන යනාදී සියලුම විභාගවලට අදාළ පොත්, සටහන්, ප්‍රශ්න පත්‍ර, ඒ සඳහා විසඳුම්, විඩියෝ දේශන ද මෙහි අන්තර්ගත කර ඇත. මෙහිදී පරිශීලකයාට සියලු තොරතුරු එක තැනකට ඒකරාශි කර ඇති නිසාවෙන් ඉතා පහසුවෙන් පරිශීලකයාට එම තොරතුරුවලට ප්‍රවේශ විය හැකි ය.

මෙහිදී,

- Source – සන්ධාර
- Content Type – මූලාශ්‍රය වර්ගය
- Subject – විෂය

යනාදී පරිදී අවශ්‍ය තොරතුරු ඉතා පහසුවෙන් පාඨකයාට ප්‍රවේශ වී ලබා ගැනීමට හැකි වන පරිදි NDLI පුස්තකාලය සකස් කර තිබේ.

එපමණක් නොව,

- Engineering - ඉංජිනේරු විද්‍යාව
- Science – විද්‍යාව
- Humanities – මානව ශාස්ත්‍ර විද්‍යාව
- Literature – සාහිත්‍ය

- Law and Management – නීතිය හා කළමනාකරණය

යන විෂය ක්ෂේත්‍රයන්ට අදාළව විශ්වවිද්‍යාල සිසුන්ට, පර්යේෂකයන්ට අවශ්‍ය තොරතුරු ලබා දෙනු ලැබේ. Audio (ශ්‍රව්‍ය), Video (දෘශ්‍ය), Notes (සටහන්), presentation (ඉදිරිපත්කිරීම්), Question Papers (ප්‍රශ්නපත්‍ර), Self Test (ස්වයං පරීක්ෂණ), solution (විසඳුම්), Syllabus (විෂය නිර්දේශ) මෙහි අන්තර්ගත වේ. තවද මෙම මූලාශ්‍රයන් File Format (ගොනු වර්ගය), භාෂාව අනුවද ලබා ගත හැකි ය. Pdf එකක් ලෙස ද Zip File එකක් ලෙසද අදාළ තොරතුරු ලබා ගැනීමට හැකි ය.

මෙලෙස විවිධ විෂය පැතිකඩ ආවරණය වන පරිදි විවිධ විද්‍යුත් මූලාශ්‍රයවලින් කොවිඩ් 19 වසංගතය තුළ පාඨක තොරතුරු පිපාසය සංසිඳුවාලීමට මෙම NDLI පුස්තකාලය කටයුතු කර ඇත.

මීට අමතරව NDLI හි Covid 19 Research Repository (කොවිඩ් 19 පර්යේෂණ කෝෂ්ටාගාරය) නම් මොඩියුලය ඔස්සේ කෝරෝනා වෛරසය පිළිබඳව ප්‍රකාශයට පත් කර ඇති ශාස්ත්‍රීය ප්‍රකාශන (Scholary publication) මෙහි අන්තර්ගත වේ. මෙහි අද වන විට ප්‍රකාශනයන් 37,348 ක් අද වන විට අන්තර්ගත කර තිබේ. ඒ සඳහා වන සෘජු ප්‍රවේශය මෙහිදී ලබා දී තිබේ.

උදා : - Emerald [Covid 19] 52 resources

ACM Digital library [Covid 19] 24 resources IEEE [Covid 19] 390 resource

යනාදි ලෙස ශාස්ත්‍රීය ප්‍රකාශනවලට ඉතා පහසුවෙන් නොමිලේ ප්‍රවේශවන්නට අවස්ථාව ලබා දී තිබේ.

මෙම Covid 19 Research Repository ය තුළ ප්‍රකාශකයින්ගේ කොවිඩ් පිටු, බ්ලොග්, අනුක්‍රමණිකා සඳහා ප්‍රවේශය ලබා දී තිබේ.

- Blog
- ACM : Open Access to ACM Digital Library During Coronavirus panedemic

- Cell press coronavirus Resource Hub
- Elsevier : Novel coronavirus information center
- Indexes

Indexes ගත් විට 5, 004 මුලාශ්‍රය ප්‍රමාණයක් දක්නට ලැබේ.

- SSRN (Preprints) coronavirus and infection disease research e – journal – 597 resources
- LIT COVID : US National library of Medicine – 529 resources
- Papers

Papers 30, 591 ක් දක්නට ලැබේ.

eg:- Cambridge University Press – coronavirus free access collection (283 resources)

Oxford University press – search with corona virus OR Covid 19 OR 2019ncov OR 5ars-cov OR mers- cov OR Hcov (4,327 resources)

මෙලෙස Covid 19 Research Repository ය තුළ ප්‍රකාශකයින්ගේ කොවිඩ් පිටු , බ්ලෝග්, අනුක්‍රමණිකා, විද්‍යුත් ලිපි සඳහා පාඨකයන්ට සෘජු ප්‍රවේශය ලබා දී තිබේ. මෙම සියලුම තොරතුරු මුලාශ්‍ර සඳහා කිසිදු මුදලක් වැය නොකර ප්‍රවේශ වීමට හැකි වීම ද මෙහි ඇති සුවිශේෂී ලක්ෂණයක් ලෙස සඳහන් කළ හැකි ය.

- මීට අමතරව කොවිඩ් 19 ආශ්‍රිත දත්ත කට්ටල (Data sets), දත්ත කෝෂ්ටාගාර (Data Repository) මෙහි අන්තර්ගත කර ඇත. එබැවින් පර්යේෂකයාට ද සාමන්‍ය ජනතාවට ද යාවත්කාලීනවන තොරතුරු ලබා ගැනීමට අවස්ථාව ලබා දී ඇත.

- කොවිඩ් 19 වසංගතය කෙරෙහි අවධානය යොමු කරන සඟරා පොදුවේ ආශ්‍රිත පර්යේෂණ සහ එවැනි පර්යේෂණ එකතුන් ද මෙහි ඇතුළත් කර ඇත.

උදා :- Covid 19 Journals Aggregators

වැනි සඟරාවලට පූර්ණ පෙළ ප්‍රවේශය සපුරාලනු ලැබේ.

Covid 19 conferences / Meetings - හරහා ඉදිරියට පැවැත්වීමට නියමිත සමුළු සම්මන්ත්‍රණ පිළිබඳව දැනුවත් කරනු ලැබේ.

- NDLI විසින් Ideas and Funding මොඩියුලය ඔස්සේ කොවිඩ් 19 වසංගතය පිටු දැකීම සම්බන්ධව සිදු කරනු ලබන පර්යේෂණයන් සඳහා විවිධ ආයතන විසින් ඉදිරිපත් කර ඇති අදහස් හා ලබා දී ඇති අරමුදල් පිළිබඳව මෙම මොඩියුලය ඔස්සේ පාඨකයන් දැනුවත් කරනු ලැබේ. තවද කොවිඩ් 19 වටා ජනනය වෙමින් පවතින සහ පර්යේෂකයන්ගේ සිතුවිලි අවුලන විවිධ අදහස් ලබා දෙන පුවත් පත් ද බ්ලොග් ද ලැයිස්තු ගත කර ඇත.

- තවද On this day , Person of the week , Topic of the week හරහා අදාළ දිනය තුළ විශේෂිත සිදුවීම් , විවිධ සුවිශේෂි පුද්ගලයන් පිළිබදව , විශේෂිත මාතෘකාවන් පිළිබදව විස්තර කරනු ලැබේ. මෙලෙස පාඨකයන්ට පොත පතේ දැනුම පමණක් සාමන්‍ය දැනුමෙන් ද ඔවුන්ව පෝෂණය කිරීමට NDLI කටයුතු කරනු ලැබේ.

මෙලෙස කොවිඩ් 19 වසංගත තත්ත්වය තුළ පාඨක තොරතුරු අවශ්‍යතා සම්පූර්ණ කිරීම සඳහා යුහුසුළුව කටයුතු කරන ඩිජිටල් කෝෂ්ටාගාරයක් ලෙස ඉන්දියාවේ ජාතික ඩිජිටල් පුස්තකාලය හැඳින්විය හැකි ය. ඒ බව NDLI පිළිබඳව උක්ත දැක්වූ නිදර්ශක ඔස්සේ මනාව විද්‍යමාන වේ.

**2. ලන්ඩන් ආර්ථික විද්‍යාව හා දේශපාලන විද්‍යාව පිළිබඳව පාසල (The London School of Economics and Political Science -LSE)**

The London School of Economics and Political Science (LSE) - ලන්ඩන් ආර්ථික විද්‍යාව හා දේශපාලන විද්‍යාව පිළිබඳව පාසල ලන්ඩනයේ ඇති ප්‍රමුඛ පෙළේ අධ්‍යාපනික ආයතනයක් ලෙස සඳහන් කළ හැකි ය. එහි ඇති පුස්තකාලය, ඩිජිටල් පුස්තකාලය හරහා කොවිඩ් 19 වසංගතය තුළ පාඨක තොරතුරු අවශ්‍යතා සපුරාලීම සඳහා විශාල දායකත්වයක් සපයන ලදී.

- මෙම LSE පුස්තකාලය තුළ පාඨකයන්ට මාර්ගගතව තොරතුරු ලබා ගැනිමේදී e – mail , library chat , Twitter, face book හරහාද සම්බන්ධ වි තොරතුරු ලබා ගැනීමට අවස්ථාව ලබා දී තිබේ.

- මාර්ගතව (online) පාඨකයන්ට තොරතුරු ලබා ගැනිමේ දී විවිධ ගැටලු ඇති විය හැකි ය.

- කියවිමේ ලැයිස්තුවේ (Reading list) සම්පත් සොයා ගැනිමේදී

- පැවරුමට අදාළ සම්පත් සොයා ගැනිමේදී

- දත්ත හා වෙනත් විශේෂඥයින්ගේ තොරතුරු ලබා ගැනිමේදී

යනාදී ගැටලුකාරි අවස්ථාවන්හිදී පාඨකයන්ට මාර්ගගතව සජීවිව ඔවුන් හා සම්බන්ධ වී ඔවුන්ගේ ගැටලු නිරාකරණය කර ගැනීමට අවස්ථාව ලබා දී ඇත.

- මෙම කොවිඩ් 19 වසංගතය තුළ LSE පුස්තකාලයට පැමිණෙන පාඨක ප්‍රමාණය සීමා කර ඇත. මෙහිදී සිසුන්ට හා කාර්ය මණ්ඩලයට අත්‍යවශය හේතුන් මත මාර්ගගත අවකාශයන් ආසනයන් වෙන් කරවා ගැනීමට හැකි විය.




(Info : https://lseuk.libcal.com/rooms.php?i=15613)

එහිදී තනි අධ්‍යයන ආසන වෙන් කරවා ගත යුතු වේ. මෙහිදී වෙන් කරවා ගැනීමට කැමති භූමිය හා දිනය තෝරාගත යුතු වේ. උක්ත රූප සටහන තුළ පෙනෙන පරිදී කොළ පැහැති පෙනෙන අවකාශයන් තුළ කැමති ඉඩකඩක් වෙන් කරවා ගත හැකි ය. මෙය මාර්ගගතව පාඨකයන්ට අවශ්‍ය අවකාශයන් වෙන් කරවා ගැනීමට හැකි ය.

- පාඨකයන්ට article - ලිපි, book chapter - පොත් පරිච්ඡේද මාර්ගගතව ඉල්ලීම් සිදු කර (online request) කර තොරතුරු ලබා ගැනීමටද අවස්ථාව ලබා දී තිබේ.

- කෝරෝනා වසංගතයත් සමග සිසුන්ට පර්යේෂකයන්ට සිය පර්යේෂණ සඳහා දත්ත රැස් කිරිමේ අපහසුතාවයන් පැන නැගෙන්නේ ය. මෙයට විසඳුමක් ලෙස LSE පුස්තකාලය විසින් සිසුන්ට හා පර්යේෂකයන්ට සිය පර්ය්ෂණ සඳහා මාර්ගගත අයුරින් දත්ත රැස් කිරීමට අවැසි උපදෙස් හා ක්‍රියාමාර්ග ලබා ගැනීමට අවස්ථාව ලබා දී තිබේ. පර්යේෂණ ව්‍යාපෘති පිළිබඳව ගැටලුවලට මුහුණ දෙන පර්යේෂකයන්ට අවශ්‍ය උපදෙස් ලබා දීම ද මාර්ගගතව සිදු කරනු ලබයි .

- කොවිඩ් 19 වසංගතය හේතුවෙන් ප්‍රදර්ශන පැවැත්විමට නොහැකිය. නමුත් මෙයට විකල්පයක් ලෙස LSE ඩිජිටල් පුස්තකාලය විසින් Online exhibition (මාර්ගගත ප්‍රදර්ශන)

පවත්වනු ලැබේ. මීට අමතරව LSE online certificate course වැනි මාර්ගගත පාඨමාලාවන් කොවිඩ් වසංගතය තුළ සහනදායි මිලට පාඨකයින්ට හැදෑරිමට අවස්ථාව ලබා දී තිබේ.

මෙලෙස කොවිඩ් 19 වසංගත තත්ත්වය තුළ LSE ඩිජිටල් පුස්තකාලය පාඨක තොරතුරු අවශ්‍යතා සම්පූර්ණ කිරීම සඳහා සුවිශාල වූ සේවාවක් ලබා දෙන බව උක්ත කරුණු ඔස්සේ මනාව විද්‍යමාන වේ.

3. **ශ්‍රී ලංකා ජාතික ඩිජිටල් පුස්තකාලය** (Natioíl Library of Sri Lanka)

මිට අමතරව ශ්‍රී ලංකා ජාතික ඩිජිටල් පුස්තකාලය ද කොවිඩ් 19 වසංගත තත්ත්වය තුළ පාඨක තොරතුරු අවශ්‍යතා සපුරාලීම සඳහා යුහුසුළුව කටයුතු කළ ඩිජිටල් කෝෂ්ටාගාරයක් ලෙස හැඳින්විය හැකි ය. කොවිඩ් 19 වසංගතය තුළ පාඨකයන්ට ඔවුන් විසින් ලබා දෙන ලද සේවාවන් පහත පරිදී පෙළ ගැස්විය හැකි ය.

- කොවිඩ් 19 වසංගතය තුළ "අපි ඔබට ඇමතුමක දුරින් ... " යන තේමා පාඨය ඔස්සේ මාර්ගගත හා දුරස්ථ සේවා මඟින් පාඨක තොරතුරු අවශ්‍යතා සපුරාලීමට කටයුතු කරන ලදී. එහිදී විද්‍යුත් ලිපිනයන් හරහා දුරකථන ඇමතුම් හරහා පාඨක තොරතුරු අවශ්‍යතා සපුරාලීම සඳහා පුස්තකාල කාර්ය මණ්ඩලය යුහුසුළුව කටයුතු කරන ලදි.

- කොවිඩ් වසංගතය හමුවේ පුස්තකාල ක්‍රියා කළ යුතු ආකාරය පිළිබඳව සාමාන්‍ය ජනතාවට, පුස්තකාල පාඨකයන්ට, පුස්තකාල කාර්ය මණ්ඩලයට සහ පාලනාධිකාරියට උපදෙස් ලබා දීම ජාතික පුස්තකාලය සතු යුතුකමක් වන්නේ ය. ඒ අනුව වසංගත තත්ත්වය හමුවේ මහජන පුස්තකාල ක්‍රියා කළ යුතු ආකාරය පිළිබඳ උපදෙස් මාලාවක් ද ප්‍රකාශයට පත් කර තිබේ.

- මෙම කොවිඩ් වසංගත තත්ත්වය තුළ ජාතික පුස්තකාලය හා කැනේඩියානු පොදු රාජ්‍ය මණ්ඩලයීය ඉගෙනුම් සංගමය (Commen wealth of Learlning Canada) මගින් ක්‍රියාත්මක

කරනු ලබන Skills Online Sri Lanka වැඩසටහන සඳහා ශ්‍රී ලාංකික පුරවැසියන්ට මුදල් ගෙවීමකින් තොරව මර්ගගතව (online) පාඨමාලා 3800 ක් පමණක් හඳුරීමට අවස්ථාව ලබා දී ඇත. එමෙන්ම එම පාඨමාලා සර්ථකව නිම කිරීමෙන් අනතුරුව ජාත්‍යන්තරව පිළිගත් සහතියක් ද නිකුත් කරනු ලැබේ. මෙම පාඨමාලාවන්ට සම්බන්ධ වීම මත පාඨකයන්ට ඔවුන්ගේ දැනුම, කුසලතා හා ඔවුන්ගේ සදුසුකම්ද වර්ධනය කර ගැනීමට අනගි අවස්ථාවක් ලැබෙන්නේ ය.

- ISBN – (International Standard Book Number- අන්තර්ජාතික ප්‍රමිත ග්‍රන්ථ අංකය), ISMC – (International Standard Music Number - අන්තර්ජාතික ප්‍රමිත සංගීත අංකය), ISSN – (International Standard Serial Number - අන්තර්ජාතික ප්‍රමිත වාරසඟරා අංකය) ලබා ගැනීමේ ඉල්ලුම් පත්‍ර online apply – මාර්ගගතව ඉල්ලුම් කිරීමට අවස්ථාව ලබා දී තිබේ.

- කොවිඩ් වසංගතය තුළ ප්‍රජාව විසින් අනුගමනය කළ යුතු සෞඛ්‍යාරක්ෂිත උපදෙස් පිළිබඳ ශ්‍රී ලංකා ජාතික ඩිජිටල් පුස්තකාලය වීඩියෝ දර්ශන - Vedio Clips, Face Book, You tube හරහා පාඨකයන්ව දැනුවත් කරන ලදී.

- මාර්ගත සම්මන්ත්‍රණ, වැඩමුළු ඔස්සේ ද පාඨකයන්ව දැනුවත් කිරීම ජාතික ඩිජිටල් පුස්තකාලය හරහා සිදු වේ. මීට අමතරව ask a librarian සේවාවද, වරණීය විඥාපන සේවාව (SDI- Selective Disimination of Information), ප්‍රවර්ධන සම්ප්‍රජානන සේවාව (CAS – Current Awarness Service) වැනි සේවාවන් රැසක් ඔස්සේ පාඨකයන්ට තොරතුරු ලබා දීමට ජාතික ඩිජිටල් පුස්තකාලය කටයුතු කරන ලදී.

මෙලෙස ඉතා සුවිශාල වූ පෘථුල සේවා සමුදායක් ජාතික ඩිජිටල් පුස්තකාලය කොවිඩ් 19 වසංගතය තත්ත්වය තුළ ලබා දෙන බව උක්ත කරුණු මඟින් මොනවට පැහැදිලි වේ.

## 4. බිල්කන්ට් විශ්වවිද්‍යාල ඩිජිටල් කෝෂ්ටාගාරය (Bilkent University Library)

Bilkent University Library - බිල්කන්ට් විශ්වවිද්‍යාල ඩිජිටල් කෝෂ්ටාගාරය ද කොවිඩ් 19 වසංගතය තුළ පාඨකයාගේ තොරතුරු අවශ්‍යතා සම්පූර්ණ කිරීම සඳහා කටයුතු කළ දෑවැන්ත ඩිජිටල් පුස්තකාලයක් ලෙස හැඳින්විය හැකි ය. මෙම ඩිජිටල් කෝෂ්ටාගාරය තුර්කියේ අන්කරාවල පිහිටා ඇත. කොවිඩ් වසංගතය තුළ බිල්කන්ට් විශ්වවිද්‍යාල ඩිජිටල් කෝෂ්ටාගාරය පාඨකයන් වෙනුවෙන් සපයනු ලබන සේවාවන් පහත පරිදී දැක්විය හැකි ය.

- කෝරෝනා වෛරසය පිළිබඳව සෑම ජාතික සහ ජාත්‍යන්තර රාජ්‍ය සංවිධානයක්ම පාහේ ඔවුන්ගේ ජනතාවට සහ මුළු ලෝකයටම කෝරෝනා වෛරසය පිළිබඳ ප්‍රතිඵල, නිල යාවත්කාලීන කිරීම් සපයයි. මෙහිදී ජාතික වශයන් එම තුර්කි ජනතාව දැනුවත් කිරීම සඳහා විශේෂ වූ Web Pages වලට යා හැකි links ඉදිරිපත් කර ඇත.

Covid 19 – The novel coronavirus disease

- මෙය තුර්කි ජනරජයේ සෞඛ්‍ය අමාත්‍යංශය විසින් නිර්මාණය කරන ලද මාර්ගෝපදේශයක් වන අතර එහිදී කෝරෝනා වෛරසය පිළිබඳව නිල හා යාවත්කාලීන දත්ත පිළිබඳ තොරතුරු සපයා ඇත.

Coronavirus Covid 19 – world map

මෙමගින් ලොව පුරා විවිධ රටවලින් රෝග විනිශ්චය, සුව කිරීම සහ මරණ දත්ත පිළිබඳ යාවත්කාලීන දත්ත ඇතුළත් වේ.

- Covid 19 Turkey web portal

යනාදී හරහා කෝරෝනා පිළිබඳව ජාතික දැනුවත් කිරීම් සිදු කරනු ලැබේ.

ජාත්‍යන්තර වශයෙන් WHO – World Health Organization,

ECDC - European Center for Disease prevention and Control, UNESCO Covid 19 Response වැනි කෝරෝනා වෛරසය පිළිබඳව ජාත්‍යන්තර වශයෙන් දනුවත් කරනු ලබන ආයතනයන්හි links ගොනුවක් මෙහි අන්තර් කරමින් පාඨකයන්ට කොරෝනා වෛරසය පිළිබඳව නවතම තතු ලබා ගැනීමට අවස්ථාව ලබා දී ඇත.

- කෝරෝනා වෛරසය පැතිර යාම හේතුවෙන් සෑම කෙනෙකුටම ගමන් බිමන් සීමා කර නිවසේ රැඳී සිටිමට නිර්දේශ කර ඇති අතර එසේම සියලු තොරතුරු, සංස්කෘතික සහ සමාජ මධ්‍යස්ථාන වසා ඇති හෙයින් සමාජ ක්‍රියාකාරකම්වලට සහභාගී විම, සමාජගත වීම වළකා ඇත. එයට විකල්පයක් ලෙස මෙම බිල්කන්ට් ඩිජිටල් පුස්තකාලය හරහා 'Stay at Home and online socialization' මොඩියුලය ඔස්සේ art (කලා), music (සංගීතය), hobby (විනෝදාංශ), leisure database (විවේකිය දත්ත පදනම්) වලට ප්‍රවේශය සපයන ලදි.

මෙම ඩිජිටල් පුස්තකාලය තුළ පවතින දත්ත පදනම් පහත පරිදී උදාහරණ සහිතව දක්විය හැකි ය.

- Art , Music and Hobby Data bases
- Naxes Music Library – මෙය සංයුක්ත තැටි, සංගීත සටහන්, කලා කෘති, ඔපෙරා සහ කලාකරුවන්ගේ චරිතාපදානයන් ඇතුළත් සම්භාව්‍ය සංගීත එකතුවකි.
- Alexandar street Music and Danced Online – කලා හා නර්තනයට අදාළ කෘති තොරතුරුවලට මෙමගින් ප්‍රවේශය සපයයි.
- Oxford Art online – මෙහි සමකාලීන කලාව හා ගෘහ නිර්මාණ ශිල්පය දක්වා දිවෙන ලිපි 200,000 ට අධික ප්‍රමාණයක් මෙහි අන්කර්ගත කර තිබේ.
- Hobbies and New skills Databases
- Mango Lanuages – මෙමගින් නව භාෂාවන් ඉගෙන ගැනීමට කැමති පාඨකයන්ට මේ හරහා තොරතුරු ලබා ගත හැකි ය. විවිධ වු භාෂා ඉගෙන ගැනීමට උපකාරි වන මාර්ගගත භාෂා ඉගෙනුම් මෙවලමකි.

- Play with a pro – මෙහිදී සම්භාව්‍ය සංගීත අධ්‍යාපනය පිළිබඳව ලෝක මට්ටමේ කලාකරුවන්, ගුරුවරුන් විසින් සපයන මාර්ගගත වීඩියෝ පාඩම්වලට - online lesson vedios සම්බන්ධ වීමට හැකි ය.

- Vidobu – fuu Vidobu දත්ත පදනම මඟින් විද්‍යා හා තාක්ෂණ, ඡායාරූපකරණය, පුද්ගලික සංවර්ධනය හා වෘත්තිය සංවර්ධනය යන ක්ෂේත්‍රවල විවිධ විනෝදාංශ සහ කුසලතා වැඩි දියුණු කිරීම සඳහා තුර්කි පුහුණු වීඩියෝ 10,000 ට වඩා සපයනු ලැබේ.

- කොරෝනා වෛරසය හේතුවෙන් බෝහෝ රටවල්හි සංස්කෘතික මධ්‍යස්ථාන සහ කෞතුකාගාර වසා ඇත. මෙම ඩිජිටල් පුස්තකාලය හරහා තුර්කියේ සහ අනෙකුත් විදේශීය රටවල්වලහි කෞතුකාගාර හා එහි එකතුන්ට Virtual tour හරහා ප්‍රවේශවීමට අවස්ථාව ලබා දී ඇත.

උදා :- Museum of Anatolian civilization, Ankara
British Museum London – England

Indian National Museum යනාදී ලොව පුරා විහිදී පවතින කෞතුකාගාර හා එහි එකතුන් නැරඹීම සඳහා ප්‍රවේශය සපයනු ලැබේ.

- කොරෝනා හේතුවෙන් සිනමාශාලා, සංගීතය හා විනෝදාස්වාද මධ්‍යස්ථාන වසා ඇති හෙයින් ප්‍රියතම කලාකරුවන්ගේ ප්‍රසංගවලට, චිත්‍රපට නැරඹීමට ඇති අවස්ථාව අහිමි වී ඇත. මෙවැනි අවස්ථාවල මාර්ගගත අංග හා ප්‍රසංගවලට (Online events and Concerts) වලට නොමිලේ සම්බන්ධ වීමට අවස්ථාව ලබා දී ඇත.

උදා :- Home Cinema and Movies
Top Documents Films
Snag Films
Live Music and Performance

මෙවැනි වැඩසටහන් හරහා නිවසට වී සිටින පාඨකයන්ගේ මානසික ආතතිය අවම කිරීමට හැකි වේ.

- ▪ මීට අමතරව මෙම වසංගත තත්ත්වය හමුවේ විශ්වවිද්‍යාල සිසුන්ට හා අනෙකුත් ශිෂ්‍යයින්ට ද සිය අධ්‍යයන කටයුතු සාර්ථකව සිදු කිරීම  සඳහා නොමිලේ විවිධ පාඨමාලා හඳුන්වා දී තිබේ. (උදා:- Academic Earth ,edx, future learn short online courses…)

- ▪ කොවිඩ් 19 තුළ නිවසේ සිට සහ දුරස්ථ අධ්‍යාපනයේ හා රාජකාරි වැඩ කිරීම සඳහා මෘදුකාංග හා මෙවලම් අත්‍යවශ්‍ය වේ. එම මෘදුකාංගවලට ප්‍රවේශ වීමට ද මෙම ඩිජිටල් පුස්තකාලය හරහා අවස්ථාව ලබා දී තිබේ. (උදා:- Ever note – Note taking, Behance- creative work and Design social media, my study life-student planner..)

ඉහතින් දැක්වූ පරිදි  බිල්කන් විශ්වවිද්‍යාල ඩිජිටල් පුස්තකාලය හරහා කොවිඩ් 19 වසංගත තත්ත්වය තුළ අනගි සේවා සමුදායක් පාඨකයින් වෙත ලබාදෙන බව විද්‍යමාන වේ.

**5. නිව්යෝර්ක් මහජන පුස්තකාලය (New York Public Library)**

නිව්යෝර්ක් මහජන පුස්තකාලය තුළ තිබෙන ඩිජිටල් කෝෂ්ටාගාරය හරහා ද කොවිඩ් 19 වසංගතය තුළ පාඨක තොරතුරු අවශ්‍යතා සම්පූර්ණ කිරීම  සඳහා පෘථුල වූ සේවාවක් සපයන ලදි.

- ▪ නිව්යෝර්ක් මහජන පුස්තකාලය ඉදිරිපිට ඇති දැවැන්ත සිංහයෙකුගේ ප්‍රතිමාවටද මුඛ ආවරණයක් දමා ඇත. ඉන් සංකේතවත් කරමින් ප්‍රකාශ කරනුයේ මෙවැනි අවස්ථාවක සියලු දෙනාම සෞඛ්‍යාරක්ෂිත ක්‍රමවේද අනුගමනය කිරීම  ඉතා වැදගත් වන බවයි.

- ▪ ඩිජිටල් මුලාශ්‍ර සඳහා 24/ 7 සේවා සැපයීමට මෙම පුස්තකාලය යුහුසුළුව කටයුතු කරනු ලැබේ. කොවිඩ් 19 තුළ e-books, e - audio books, databases විශාල ප්‍රමාණයකට පාඨකයන්ට

ප්‍රවේශය සපයනු ලැබේ. තවද මෙම අභියෝගාත්මක කාලයේ දී ප්‍රජාවට අවශ්‍ය තොරතුරු සොයා ගැනීමට අවශ්‍ය සහය පුස්තකාල කාර්ය මණ්ඩලය මාර්ගගත ප්‍රවේශය ඔස්සේ නිරතුරු සැපයීමට කටයුතු කරනු ලැබේ.

■ කොවිඩ් වසංගත තත්ත්වය තුළ සියලුම පාසල් ශිෂ්‍යයන්ට, විශ්වවිද්‍යාල ශිෂ්‍යයින්ට සිය පාසල්, විශ්වවිද්‍යාල වෙත ගොස් අධ්‍යන කටයුතුවල නියළීමට ඇති අවකාශය ඇණ හිට ඇත. මෙයට විකල්පයක් ලෙස මෙම පුස්තකාලය හරහා, චරු school – 2nd grade (පෙර පාසල් – 2 වසර ), 3rd grade – 5th grade (3 වසර – 5 වසර ), Middle school (6-11), High school (උසස් අධ්‍යාපනය) වෙන වෙනම අදියරයන් ඔස්සේ මාර්ගගත අයුරින් සේවා සපයනු ලැබේ. (උදා:- Storyline online , bookflix – විවිධ කුඩා දරුවන්ගේ ග්‍රන්ථ මුලාශ්‍රයන්ට තොරතුරු සපයයි, PBS kids – online games play කිරීමට දල fun vedios නැරඹීමට ද කුඩා දරුවන්ට ද අවස්ථාව ලබා දී තිබේ.)

■ Online Research Assistance - මාර්ගගත පර්යේෂණ සහකාර කෙනෙකු හරහා සම්බන්ධ වි පර්යේෂණ ක්ෂේත්‍රවල නියුතු වුවන්ට අවශ්‍ය තොරතුරු ලබා ගැනීමට අවස්ථාව ලබා දී තිබේ. තවද පුර්ණ පෙළ දත්ත පදනම්වලට නොමිලේ ප්‍රවේශ වි තොරතුරු ලබා ගැනිමට ද, එම තොරතුරු භාගත කර ගැනීමට ද පාඨකයාට අවස්ථාව ලබා දී ඇත.

මෙලෙස උක්ත සඳහන් කළ පරිදි නිව්යෝර්ක් මහජන පුස්තකාලයේ ඩිජිටල් කෝෂ්ටාගාරය හරහා ඉතා සුවිශාල වු සේවා සමුදායක් ලබාදෙන බව මනාව ප්‍රකට වේ.

### 6. කොළඹ විශ්වවිද්‍යාල විද්‍යුත් කෝෂ්ටාගාරය (University of Colombo Electronic Repository- UCER)

කොළඹ විශ්වවිද්‍යාල විද්‍යුත් කෝෂ්ටාගාරය (University of Colombo Electronic Repository - UCER) යනු නිතිපතා යාවත්කාලීන වන අඛණ්ඩව නව එකතු කිරීම් එකතු කරනු ලබන ස්ථානයකි. එමෙන්ම කොවිඩ් 19 වසංගතය තුළ ද විශ්වවිද්‍යාල

සිසුන්ගේ, අධ්‍යයන කාර්ය මණ්ඩලයයේ, අනධ්‍යන කාර්ය මණ්ඩලයගේ සහ අනෙකුත් පාඨකයින්ගේ තොරතුරු අවශ්‍යතා සම්පූර්ණ කිරීම සුවිශාල වූ සේවා සමුදායක් මෙම විද්‍යුත් කෝෂ්ඨාගාරය හරහා ලබා දෙනු ලැබේ. එසේ පාඨකයන්ට ලබා දෙන සේවාවන් පහත පරිදි පෙළ ගැස්විය හැකි ය.

- Emerald , JSTOR, Oxford Journals, Hein online, Taylor and Francis වැනි දත්ත පදනම් ඔස්සේ ප්‍රවේශ විමට අවස්ථාව ලබා දී ඇත. කොවිඩ් වසංගතයත් සමඟම පුස්තකාලවලට පාඨකයන්ට ප්‍රවේශ විමට නොහැකි නිසා බෝහෝ පාඨකයන් මෙම දත්ත පදනම් පරිශිලනය කිරීමට පෙළඹී ඇත. එවැනි අවස්ථාවන්හි දී මෙම දත්ත පදනම් පරිශීලනය කරන අයුරු පිළිබඳව බෝහෝ පාඨකයන්ට විවිධ ගැටලු ඇති විය හැකිය. එයට විකල්පයක් ලෙස පුස්තකාල කාර්ය මණ්ඩලය විසින් එම දත්ත පරිශිලනය කර තොරතුරු ලබා ගන්නා අයුරු පිළිබඳව video clips හරහා පාඨකයන්ව දැනුවත් කර ඇත.

- Document Delivery Service (DSS) මාර්ගගතව පාඨකයන්ට අවශ්‍ය තොරතුරු බෙදා හැරීම මෙම ඩිජිටල් කෝෂ්ඨාගාරය හරහා පාඨකයන්ට කොවිඩ් තුළ ලබා දෙන තවත් එක් සේවාවක් ලෙස හැඳින්විය හැකි ය. එහිදී පාඨකයන්ට අවශ්‍ය තොරතුරු online පෝරමය පුරවා submit කිරීමෙන් අවශ්‍ය තොරතුරු යුහුසුළුව ලබා ගැනීමට හැකිය. එමෙන්ම එක් එක් පිඨයන්ට අදාළ තොරතුරු වෙනම නිලධාරින් හා ඔවුන්ගේ විද්‍යුත් ලිපිනයන් (e-mail) හරහා ලබා ගැනීමට අවස්ථාව ලබා දී තිබේ.

- Online webinar (මාර්ගගත සමුළු) පවත්වා ඇත. (උදා:- Challenges imposed on libraries by covid 19 and the new normal service paradigm by Dr. Mrs Pradeepa Wijethunga)

- කොවිඩ් 19 වෛරසයෙන් වැළකෙන අයුරු පිළිබඳව, අනුගමනය කළ යුතු සෞඛ්‍යාරක්ෂිත උපදෙස් පිළිබඳව විද්‍යුත් පෝස්ටර්, දැන්විම් හරහා දැනුවත් කර ඇත. තවද covid 19

e-learning module එකක් හරහා කොරෝනා වෛරසය පිළිබඳව පාඨකයන් දැනුවත් කර ඇත.

- Student and Staff wellbeing නම් මොඩියුලය ඔස්සේ Living and learning with covid 19 තේමාව පාදක කර ගනිමින් විවිධ වැඩසටහන් මාර්ගගතව පවත්වන ලදි. ඒ අනුව මෙම වසංගතය තුළ විශ්වවිද්‍යාල සිසුන්ගේ අධ්‍යයන, අනධ්‍යයන කාර්ය මණ්ඩලයයේ සහ අනෙකුත් සියලුම ප්‍රජාවගේ මානසික මට්ටම පවත්වාගෙන යනු ලබන විවිධ වැඩසටහන් මාර්ගගතව ක්‍රියාත්මක කර ඇත.

- "Last maintain our psychology well- being during these times : a talk with a an opportunity to ask question" මෙවැනි මාතෘකා පාදක කරගනිමින් පාඨකයන්ගේ තිබෙන ගැටලු සාකච්ඡා කරමින් ඔවුන්ගේ මානසික තත්ත්වය වර්ධනය කිරීමට කටයුතු කරනු ලැබේ. එසේම මානසික මට්ටම පමණක් නොව නිවසට වී සිටින විද්‍යාර්ථීන්ගේ සිය ශාරිරික සෞඛ්‍ය ද පවත්වාගෙන යාම සඳහා විශ්වවිද්‍යාලයේ ක්‍රිඩා අංශයේ විද්‍යාර්ථීන් විසින් ශාරීරික ව්‍යායාම් ඇතුළත් video clips එකතුවක් ඉදිරිපත් කර ඇත. එවැනි වීඩියෝ නැරඹීම සඳහා ප්‍රවේශ වන්නට ද මෙම ඩිජිටල් කෝෂ්ටාගාරය හරහා අවස්ථාව ලබා දී  තිබේ.

- එසේම මෙම කොරෝනා වසංගතය තුළ ඉතාමත් ප්‍රයෝජනවත් අංශ සඳහා පාඨකයන්ට ප්‍රවේශ වන්නට quick links ඉදිරිපත් කර ඇත. මීට අමතරවල වරණිය විඥාපන සේවාව (SDI- Selective Disimination of Information), ප්‍රවර්තන සම්ප්‍රජානන සේවාව (CAS – Current Awarness Service) වැනි සේවාවන් රැසක් ඔස්සේ පාඨකයන්ට තොරතුරු ලබාදීම ට UCER කටයුතු කරනු ලැබේ.

ඒ අනුව කොවිඩ් 19 වසංගතය තුළ UCER – (University of Colombo Electronic Repository) – කොළඹ විශ්වවිද්‍යාල විද්‍යුත් කෝෂ්ටාගාරය විශාල සේවා සමුදායක් ලබා දෙන බව ඉහත දැක්වූ කරුණුවලින් විද්‍යමාන වේ.

## 7. කැලණිය විශ්වවිද්‍යාල ඩිජිටල් කෝෂ්ඨාගාරය (University of Kelaniya Repository)

මිට අමතරව කැලණිය විශ්වවිද්‍යාල ඩිජිටල් කෝෂ්ඨාගාරය හරහා ද කොවිඩ් 19 කාලය තුළ පාඨකයන්ගේ තොරතුරු අවශ්‍යතා ඉටු කිරීම සඳහා විශාල දායකත්වයක් සපයා ඇත. එහිදී ලබා දෙනු ලැබූ සේවාවන් පහත පරිදී දැක්විය හැකි ය.

- විශ්වවිද්‍යාල සිසුන්ට හා කාර්ය මණ්ඩලයට Document Supply Services – මාර්ගගතව ලිපි ගොනු බෙදා හැරිමේ සේවාව ක්‍රියාත්මක වන ලදි. එහිදී විශ්වවිද්‍යාලයේ සියලු පීඨවලට අදාළව (Faculty of commerce and management studies, Faculty of computing and Technology, Faculty of Graduate studies, Faculty of Humanities, Faculty of Medicine, Faculty of Science, Faculty of Social studies) Senior Assistant Librarian – ජ්‍යෙෂ්ඨ සහකාර පුස්තකාලාධිපතිවරයෙකු හරහා online document supply form tl mqrjd submit කිරීමෙන් අදාළ තොරතුරු යුහුසුළුව ලබා ගැනීමට පහසුකම් සපයන ලදී.

- Ask a librarian වැනි සේවාවන්ගෙන් ද පාඨකයන්ට සේවා ලබා දෙන ලදි. skype තාක්ෂණය හරහාද තමන්ට තිබෙන ගැටලු ඇසීමට ද ඒ සඳහා පිළිතුරු ලබා ගැනීමට පුස්තකාලාධිපති හා සම්බන්ධ වීමට ද පහසුකම් සපයන ලදී.

- පුස්තකාල පාඨකයන්ට දත්ත පදනම් පරිශීලනය කරන අයුරු පිළිබඳව video clips හරහා උපදෙස් ලබා දී තිබේ.

- මිට අමතරව වරණිය විඥාපන සේවාව (SDI- Selective Disimination of Information), ප්‍රවර්තන සම්ප්‍රජානන සේවාව (CAS – Current Awarness Service) වැනි සේවාවන් රැසක් ඔස්සේ පාඨකයන්ට තොරතුරු ලබාදීමට කටයුතු කරනු ලදී.

- කොවිඩ් 19 වෛරසයෙන් මිදීමට අවශ්‍යවන්නා වූ සෞඛ්‍යාරක්ෂිත උපදෙස් පිළිබඳ විද්‍යුත් පෝස්ටර්, දැන්විම් හරහා පාඨකයන්ව දැනුවත් කර ඇත.

මේ ආදී සුවිශේෂී කාර්ය භාරයන් රැසක් කොවිඩ් වසංගතය තුළ පාඨකයන් වෙනුවෙන් ලබා දීමට කැලණිය විශ්වවිද්‍යාල ඩිජිටල් කෝෂ්ටාගාරය කටයුතු කර ඇත.

**නිගමනය**

කොවිඩ්-19 වසංගතය සමග ලෝකය මුහුණ දුන් අභියෝගාත්මක අවස්ථාව තුළ, පුස්තකාලයන් සම්ප්‍රදායික භූමිකාවන් ඉක්මවමින්, ඩිජිටල් තාක්ෂණය මත පදනම් වූ නව සේවා ආකෘති හඳුන්වා දෙන ලදි. ඉන්දියාවේ ජාතික ඩිජිටල් පුස්තකාලය (National Digital Library of India – NDLI), ලන්ඩන් ආර්ථික විද්‍යාව හා දේශපාලන විද්‍යාව පිළිබඳව පාසල (The London School of Economics and Political Science -LSE), ශ්‍රී ලංකා ජාතික ඩිජිටල් පුස්තකාලය (Natioíl Library of Sri Lanka), බිල්කන්ට් විශ්වවිද්‍යාල ඩිජිටල් කෝෂ්ටාගාරය (Bilkent University Library), නිව්යෝර්ක් මහජන පුස්තකාලය (New York Public Library), කොළඹ විශ්වවිද්‍යාල විද්‍යුත් කෝෂ්ටාගාරය (University of Colombo Electronic Repository- UCER) සහ කැලණිය විශ්වවිද්‍යාල ඩිජිටල් කෝෂ්ටාගාරය (University of Kelaniya Repository) වැනි ආයතන මගින් පාඨකයන්ට අවශ්‍ය තොරතුරු නිවසේ සිටම ලබාදීම සඳහා ඉතා සාර්ථක ව්‍යාපෘති ක්‍රියාත්මක කරන ලදි. එමගින් අධ්‍යාපන පරිසරය පවත්වාගෙන යාමට, පර්යේෂණ කටයුතු ඉදිරියට ගෙනයාමට සහ මානසික සතුට ලබාදීමට පුස්තකාලයන් ඉතා සාර්ථකව දායකව සිටින ලදි. මේ අනුව කොවිඩ් 19 වසංගත තත්ත්වය තුළ පාඨක තොරතුරු අවශ්‍යතා සම්පූර්ණ කිරීම සඳහා දේශීය හා විදේශීය වශයෙන් ඩිජිටල් පුස්තකාල රැසක් දායකත්වය සපයා ඇත. ඒ බව ඉහත දැක්වූ කරුණු හා නිදර්ශනවලින් ද මනාව විද්‍යමාන වේ.

**ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය**

Academic Earth. (n.d.). Free online courses from leading universities. https://academicearth.org

ACM Digital Library. (n.d.). COVID-19 open access collection. https://dl.acm.org

ACM. (n.d.). Open access to ACM Digital Library during coronavirus pandemic. https://dl.acm.org

Behance. (n.d.). Creative design platform. https://www.behance.net

Bilkent University Library. (n.d.). COVID-19 library support services. https://library.bilkent.edu.tr

BookFlix. (n.d.). Interactive storybooks. https://bookflix.digital.scholastic.com

British Museum. (n.d.). Virtual tours and collections. https://britishmuseum.org

Cambridge University Press. (n.d.). Coronavirus free access collection. https://www.cambridge.org

Cell Press. (n.d.). Coronavirus resource hub. https://www.cell.com/2019-nCOV

Commonwealth of Learning (COL). (n.d.). Skills Online Sri Lanka. https://www.col.org/skills-online-sri-lanka

Datareportal. (2020, July). Digital 2020: July global statshot. https://datareportal.com/reports/digital-2020-july-global-statshot

Datareportal. (2020, October). Digital 2020: October global statshot. https://datareportal.com/reports/digital-2020-october-global-statshot

Elsevier. (n.d.). Novel coronavirus information center. https://www.elsevier.com/connect/coronavirus-information-center

Emerald Publishing. (n.d.). COVID-19 research resources. https://www.emerald.com/insight

Evernote. (n.d.). Note taking and organization tool. https://evernote.com

Falt, E., & Das, P. P. (n.d.). Manifesto for digital libraries. UNESCO and the International Federation of Library Associations and Institutions (IFLA).

FutureLearn. (n.d.). Short online courses. https://www.futurelearn.com

IEEE Xplore. (n.d.). IEEE COVID-19 resources. https://ieeexplore.ieee.org

Indian National Museum. (n.d.). Virtual access to collections. https://museumsofindia.gov.in

LIT COVID. (n.d.). US National Library of Medicine COVID-19 database. https://www.ncbi.nlm.nih.gov/research/coronavirus/

Mango Languages. (n.d.). Language learning online. https://mangolanguages.com

Museum of Anatolian Civilizations. (n.d.). Virtual tour. https://muze.gov.tr

My Study Life. (n.d.). Student planner app. https://www.mystudylife.com

National Digital Library of India. (n.d.). Stay at home and study through NDLI. https://www.ndl.gov.in

Naxos Music Library. (n.d.). Classical music streaming service. https://www.naxosmusiclibrary.com

Oxford Art Online. (n.d.). Art research and reference. https://www.oxfordartonline.com

Oxford University Press. (n.d.). COVID-19 research content. https://academic.oup.com

PBS Kids. (n.d.). Educational games and videos for kids. https://pbskids.org

Play with a Pro. (n.d.). Online music lessons. https://www.playwithapro.com

SnagFilms. (n.d.). Documentaries and independent films. [Discontinued, formerly at https://www.snagfilms.com]

SSRN. (n.d.). Coronavirus and infectious disease research e-journal. https://www.ssrn.com

Storyline Online. (n.d.). Children's literacy videos. https://www.storylineonline.net

The London School of Economics and Political Science (LSE). (n.d.). Library services during COVID-19. https://lseuk.libcal.com

University Grants Commission – Sri Lanka. (n.d.). Skills Online Sri Lanka Programme. https://ugc.ac.lk

University of Colombo. (n.d.). University of Colombo Electronic Repository (UCER). https://lib.cmb.ac.lk/ucer

University of Kelaniya. (n.d.). Library services. https://library.kln.ac.lk

Vidobu. (n.d.). E-learning and professional development. https://www.vidobu.com